SINHALESE

AEC Australian Electoral Commission

# නැවතී සළකා බලන්න

## මෙවර මහ චන්දය පිළිබද මූලාශ්‍ර පිරික්සන්න

**මහමැතිවරණයක් අතරතුර ඔබේ චන්දයට බලපෑම් කිරීම උදෙසා විශාල ප්‍රමාණයක තොරතුරු ප්‍රමාණයක් බෙදාහරිනු ඇත.ඔබ විසින් දකිනු, අසනු සහ කියවනු ලබන දෑ සළකා බැලීම වැදගත්ය. තොරතුරු පිලිබද ඔබට සැක ඇති නම් ඔබේම ආකල්ප ඇති කරගැනීම උදෙසා සහ තීරණයකට එළඹීම පිණිස උපකාරීවන ප්‍රශ්න ඇසීමට ඔබට හැකිය.**

## චන්දදායකු ලෙස ඔබේ භූමිකාව

තොරතුරු පිළිබද පහත දෑ දැනගැනීමට කාලය වැය කරන්න:

### විශ්වසනීයභාවය

**එය විශ්වාසවන්ත හෝ පිළිගත හැකි මූලාශ්‍රයකින් ලැබුන දෙයක්ද?**

තොරතුරෙහි මූලාශ්‍රය ඔබ දනීද? එය බලයලත් මාධ්‍ය ආයතනයකින් හෝ තහවුරු කරගත් සමාජ මාධ්‍ය ගිණුමකින් ලැබුන දෙයක්ද? මැතිවරණ නීති මගින් සන්නිවේදනයන්හි සත්‍යභාවය පාලනය කරනු නොලබයි.

### කාලීන

**එය පළකරනු ලැබුයේ කවර කළෙකදීද?**

මේ දිනවල යම් දැන්වීමක්/ලිපියක් පළවූ හෙයින්ම එය කාලීන බවක් අදහස් නොවේ. සැමවිටම පාදකවූ මූලාශ්‍රයෙහි සහ ප්‍රකාශණයෙහි දිනය පිරික්සන්න.

### ප්‍රවේසම් සහිත

**එය වංචා සහගත විය හැකිද?**

සමාජ මාධ්‍යයන්හි හෝ අනෙකුත් ඩිජිටල් වේදිකාවන්හි සන්නිවේදනය වන තොරතුරෙහි මූලාශ්‍රය හෝ අන්තර්ගතය පිළිබදව ඔබට සැක උපදී නම්, ඒ හා පරීක්ෂාවෙන් යුතුව සිතා බලා සම්බන්ධවීම වැදගත් වේ.

හැකි අවස්ථාවන්හිදී, තොරතුරෙහි මූලාශ්‍රය හා සම්බන්ධ වියහැකි ආකාරයන් පිළිබදව ඔබ පිරික්සිය යුතුය.

## AEC හි භූමිකාව

ඔස්ට්‍රේලියානු මැතිවරණ කොමිසම (AEC) යනු මහ මැතිවරණය පැවැත්වීමේ කාර්යයය පැවරුන ස්වාධීන ආයතනයයි. AEC හි භූමිකාව:

**මැතිවරණ ක්‍රියාදාමය පිළිබද විශ්වාසවන්ත තොරතුරු සැපයීමය**

AEC, එහි ප්‍රචාරණ ව්‍යාපාරය, වෙබ් අඩවිය, සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සහ සමාජ මාධ්‍ය ගිණුම් හරහා, ලියාපදිංචි වන, චන්දය ප්‍රකාශ කරන හෝ අපේක්ශකයකු ලෙස තරග වදින ආකාරය පිළිබද තොරතුරු සදහා පහසු ප්‍රවේශයක් සළසනු ඇත.

මෙකී මැතිවරණ ක්‍රියාදාමයන් පිලිබදව යම්කිසි සාවද්‍ය තොරතුරක් ඇත්නම්, එකී වාර්තාව නිවැරදි කිරීමට AEC කටයුතු කරනු ඇත. මෙකී මැතිවරණ ක්‍රියාදාමයන්ගෙන් පරිබාහිරව – මැතිවරණ සන්නිවේදනයන්හි සත්‍යභාවය පිරික්සීමේ කිසියම්මවූ භූමිකාවක් AEC සතු නොවේ.

**මැතිවරණ සන්නිවේදනයන් බලාත්මක කිරීම විමසීම**

ඔබට තොරතුරු හා සම්බන්ධ එකී මූලාශ්‍රයන් දැනගැනීමට උපකාරී වීම පිණිස සමහර මැතිවරණ සන්නිවේදනයන් සදහා බලාත්මක කිරීමක් අවශ්‍ය වනු ඇත.පැමිණිල්ලක් ලැබුනු විට, නිසියාකාරව බලාත්මක නොකෙරුනු මැතිවරණ සන්නිවේදනයන් AEC මගින් විමසීමට ලක් කරනු ඇත.




aec.gov.au 13 23 26


කැන්බරාහි, මැතිවරණ කොමසාරිස්වරයාගේ අවසරය පරිදිය
Authorised by the Electoral Commissioner, Canberra